# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2424/49 - 2025 පෙබරවාරි මස 19 වැනි බදාදා - 2025.02.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

යොමු අංකය : එච්ජ්කේ/එල්ඒඑන්/1/19.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, හක්මණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මුරුතමුරේ බටහිර කොට්ඨාසයේ අංක 293 බී, මුරුතමුරේ බටහිර ගමේ පිහිටි, මාතර දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් මැන සකස් කර ඇති කැඩැස්තර සිතියම් අංක 820398 හි කලාප අංක 03, පත්‍ර අංක 1 හි සඳහන් පහත විස්තර දැක්වෙන ඉඩම් කැබැල්ල:

01. කැබලි අංක 01

ඉඩමේ නම: ගමගෙයිදිවෙලේ මැද ඉරිකොන්ද සහ ගොඩඉරිකොන්ද; හිමිකම් කියන්නා:හේවා වලිමුනිගේ නිහාල් ප්‍රේම කුමාර, අංක 347/1 පොලිසිය පාර, හක්මණ;ප්‍රමාණය: හෙක්ටයාර් 0.0304.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියකියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025 මැයි මස 28 වැනි දින පෙරවරු 10.00 ට හක්මණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2025 මැයි මස 07 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශ්‍යතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

තීක්ෂණ දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
හක්මණ.

2022 පෙබරවාරි මස 07 වැනි දින,
හක්මණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 02 - 00179

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

යොමු අංකය: ඩබ්ලිව්ජී/එල්ඒඑන්/එල්8/ඒසීකිව්/60.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම /පරවශතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම්



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 399 A, නිදංගල ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ වරකපිටිය ගමේ පිහිටි, ක.සි. අංක 820075 හි මතු සඳහන් ඉඩම නිදංගල ග්‍රාම නිලධාරි වසමේ සේවා පියසක් ඉදිකිරීම සඳහා අත්කර ගැනීමට අවශ්‍යව ඇත.

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: නිදංගල කොළණිය; හිමිකම් කියන්නා:විතානගේ විලියම්;ප්‍රමාණය: හෙක්ටයාර් 0.0506.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියකියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025 අප්‍රේල් මස 28 වැනි දින පෙරවරු 10.00 ට වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2025 අප්‍රේල් මස 07 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශ්‍යතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ටී.එල්.එන්.එස්.මෙන්ඩිස්,
ප්‍රාදේශීය ලේකම්,
වැලිගම.

2025 පෙබරවාරි මස 17 වැනි දින,
වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 02 - 0180

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.